# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

**பொலிஸ் ஊடகப் பிரிவு**

**POLICE MEDIA DIVISION**

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.08 පැය 2110 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/685/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්‍ා වූ වැදගත් තොරතුරු</u>**

**01. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීමට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - ගාල්ල අපරාධ කොට්ඨාසය.**

2025.04.03 වන දින රාත්‍රී කාලයේ හික්කඩුව පොලිස් වසමේ කුමාරකන්ද ප්‍රදේශයේ මාගර්ය අසල රැඳී සිටි කාන්තාවකට හා පුද්ගලයෙකුට යතුරුපැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් වෙඩි තබා පිරිමි පුද්ගලයා ඝාතනය කර කාන්තාව තුවාල ලැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් හික්කඩුව පොලිසිය හා ගාල්ල අපරාධ කොට්ඨාසය මගින් විමශර්න ආරම්භ කර තිබුණි.

2025.04.07 වන දින මෙම වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් අවශ්‍ය කර සිටි සැකකරුවෙකු නීතිඥයෙකු මාගර්යෙන් ගාල්ල අපරාධ කොට්ඨාසය වෙත ඉදිරිපත් වීමෙන් පසු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 26 ක් වන දොඩම්දූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු 2025.04.08 වන අද දින ගාල්ල ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු දින 01ක් රඳවුම් නියෝග ලබාගෙන ඇති අතර ගාල්ල අපරාධ කොට්ඨාසය  වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.**

2025.04.08 වන දින උදෑසන කාලයේ ගොතටුව පොලිස් වසමේ ජී.බී පෙරේරා මාවත ප්‍රදේශයේදී බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 50 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 45 ක් වන කොලොන්නාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. නීති විරෝධී මත්පැන් සමග සැකකාරියක් අත්අඩංගුවට - ඇහැලියගොඩ පොලිස් ස්ථානය.**

2025.04.08 වන දින සවස් කාලයේ ඇහැලියගොඩ පොලිස් වසමේ ගැටහැත්ත ප්‍රදේශයේදී ඇහැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 97 (බෝතල් 130)ක් සමග සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකාරිය වයස අවුරුදු 67 ක් වන ගැටහැත්ත ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ඇහැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තන්තිරිමලය පොලිස් වසම.**

2025.04.08 වන දින තන්තිරිමලය පොලිස් වසමේ තන්තිරිමලය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මාලිගාතැන්න ප්‍රදේශයේ වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 37 ක් වූ තන්තිරිමලය ප්‍රදේශයේ පදිංචිකුවෙකු වේ.**

තන්තිරිමලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**